
# ගංජා: දේශීයත්වය මුලාකරමින් එන බහුජාතික නැගිටීම.

වෛද්‍ය දිනෙත් බණ්ඩාර

ගංජා භාවිතය නීතිගත කිරීම සඳහා ලොව පුරා අතිමහත් උත්සාහයක් ඇත. එම උත්සාහය සාර්ථක කර ගැනීම සඳහා විවිධ රටවල විවිධ උපාය මාර්ග සහ තේමාවන් භාවිතා වේ. නිදසුනක් වශයෙන් කැනඩාවේ දී මිනිසුන්ට තමන්ගේ තේරීම් අනුව ක්‍රියාකිරීමට සැමවිටම අයිතියක් ඇත යන ලිබරල් වාදී මතය ඒ සඳහා භාවිතා කරන ලදී.

ශ්‍රී ලංකාවේදී ගංජා ප්‍රචාරණය හා නීතිගත කිරීම සාධාරණීකරනය සඳහා භාවිතා කරන උපක්‍රමය වන්නේ ගංජා දේශීය ශාකයක් බවත් ගංජා භාවිතය දේශීය සංස්කෘතික අංගයක් බවත් විදහා දක්වීමයි. තමන් ලිබරල්වාදීන් යැයි සිතා ගන්නා අතළොස්සක් දෙනා ද මෙය ලංකාවේ නීතිගත කිරීමට අවශ්‍යයයි පවසති.

## ගංජා භාවිතය සෞඛ්‍යයට හානි කරන බව හොඳින් තහවුරු වී ඇත.



දැනට එක් එක් රටවල ගංජා භාවිතා කරන්නන්ගේ සංඛ්‍යාව සාපේක්ෂව ඉතා අල්ප බැවින් මෙම හානිය මහා පරිමාණයෙන් දැකගත හැකි නොවේ.

භාවිතා කරන්නන්ගේ සංඛ්‍යාව සහ එහි ව්‍යාප්තිය වඩාත් පුළුල් වන විට ගංජා භාවිතයේ හානි මහා පරිමාණයෙන් සිදුවනු අපට පෙනෙනු ඇත. මානසික අවපීඩනය හා භින්නෝන්මාදය වැනි මානසික රෝගත්, වෙනත් මත්ද්‍රව්‍ය භාවිතයත්, තරුණ වයසේදී මොළයේ වර්ධනය අඩාල කිරීමත්, දරුණු පෙනහළු රෝගත් මෙයට ඇතුළත් වේ.

දැන් දක්නට නොලැබෙන සමහර බලපෑම් පවා අපට අනාගතයේදී පෙනෙනු ඇත. නිදසුනක් වශයෙන්, අප අතීතයේ මත්පැන් නිසා ඇති වන බවට හඳුනාගත් රෝග ලැයිස්තුවට පිළිකා රෝගත් දැන් ඇතුලත්ව ඇත.


ශ්‍රී ලංකාවේ විශාල පිරිසක් ගංජා සහිත නිෂ්පාදන භාවිතා කිරීමට පටන් ගතහොත් මාර්ග අනතුරු නිසා සිදුවන තුවාල හා මරණ විශාල ලෙස වැඩි වනු ඇත. දැනටමත් ගංජා භාවිතය වැඩි රටවල මෙම තත්වය දක්නට ලැබේ. එසේම අඩු ආදායම්ලාභීන් ගංජා සඳහා විශාල වශයෙන් මුදල් වියදම් කිරීම නිසා දරිද්‍රතාවය තව තවත් පැතිරෙනු ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් එකසිය අනූ ගනණකට වැඩි ප්‍රමාණයකින්

## දැනට ගංජා භාවිතය නීතිගත කර ඇත්තේ රටවල් දෙකක් පමණි.

තවත් රටවල් කිහිපයක ප්‍රාන්ත හෝ ප්‍රදේශ කිහිපයක පමණක් මෙසේ ගංජා භාවිතය නීතිගත කර ඇත.

ගංජා නීතිගත කර ඇති ස්ථානවල, පෙර පැවති කුඩා පරිමාණයේ නීති විරෝධී ගංජා වෙළඳාම ජාත්‍යන්තර සම්බන්ධතා ඇති විශාල ව්‍යාපාරයක් බවට පත්ව ඇත. විශාල ගංජා සමාගම් දැන් රටවල් කිහිපයක නීත්‍යානුකූලව ක්‍රියාත්මක වේ.



## දැනටමත් ලෝකයේ විශාලතම ගංජා සමාගම් ඉතා විශාල දුම්කොළ හා මධ්‍යසාර කර්මාන්ත සතු වනු ඇති බව පෙනෙන්නට තිබේ.

ලෝකයේ විශාලතම දුම්කොළ සමාගම දැනටමත් උතුරු ඇමරිකාවේ විශාල ගංජා සමාගමක් සඳහා ඩොලර් බිලියන ගණනක් ආයෝජනය කර ඇත. මධ්‍යසාර කර්මාන්තය ද ගංජා සමාගම් සඳහා ඩොලර් බිලියන ගණනක් ආයෝජනය කර ඇත.

මත්පැන් කර්මාන්තය දැනටමත් ගංජා ඇතුලත් කළ බීර වර්ග අත්හදා බලමින් සිටී. රට බීම සමාගම් ද ගංජා ඇතුලත් නිෂ්පාදන අත්හදා බැලීම ආරම්භ කර ඇත. ගංජා සඳහා දුම්කොළ කර්මාන්තය දක්වන උනන්දුව කුමක්දැයි අමුතුවෙන් කිව යුතු නැති අතර දැනටමත් ඊ-සිගරට් හරහා ගංජා භාවිතය උතුරු ඇමරිකාවේ සිදුවෙමින් පවතී.

මෙම ව්‍යාපාර ඔවුන්ගේ නිෂ්පාදන සඳහා ලෝකයේ බොහෝ රටවල වගා කරන සාම්ප්‍රදායික හෝ දේශීය ගංජා භාවිතා නොකරයි. ජානමය වශයෙන් වෙනස් කරන ලද ගංජා ප්‍රභේද හරහා එහි ක්‍රියාකාරී රසායනික

සංඝටක වල ප්‍රතිශත වැඩි කර මෙම ගංජා නිෂ්පාදනය කරනු ලබයි. තම ගංජා නිෂ්පාදන භාවිතා කරන්නන් ඊට ඇබ්බැහි වන ප්‍රමාණය වැඩි කර භාවිතය දිගින් දිගටම පවත්වා ගෙන යාම ඔවුන්ගේ අරමුණයි.

අප රටේ දුම්කොළ හා මධ්‍යසාර සමාගම් සම්බන්ධයෙන් ඇති අත්දැකීම් අනුව, ගංජා නීතිගත කිරීම සඳහා මතයන් ගෙනයාමට අපගේ වැනි රටවල් තුල ඔවුන් භාවිතා කරනු ඇති බලය යමෙකුට සිතාගත හැකිය.



**බහුජාතික සමාගම් වල අරමුණ ජාන වෙනස් කළ ගංජා ශ්‍රී ලංකාවේ මෙන්ම වෙනත් රටවල වගා කිරීමයි.**

මෙහි “දේශීය” හෝ සාම්ප්‍රදායික කිසිවක් නැත. ඒ සඳහා දේශීය දේ හා දේශීය ක්‍රම අගයන, ඒවාට ගරු කරන්නන් රවටා ඔවුන් නොදැනම තම අතකොළු ලෙස නිර්ලජ්ජිතව භාවිතා කිරීම ශ්‍රී ලංකාවේ පවා සිදුවනු ඇත. මෙහිදී “දේශීය” ලෙස පෙනී සිටින සමහරෙක් දැන දැනම මෙම විදේශීය න්‍යායාය පත්‍රයේ කොටස්කරුවෝ වනු ඇත.

ගංජා වගා කොට ගංජා ආශ්‍රිත නිෂ්පාදන පිටරට යැවීමෙන් අප්‍රමාණ ලෙස ලාභදායක බව පවසමින් රජයන් ඒ සඳහා දිරි ගැන්වීමද දැන් සිදුවේ ගංජා වගාව සඳහා දැනට ඇති නීතමය තහනම යම් දුරකට ලිහිල් කර ගැනීම මෙහි මූලික පරමාර්ථයයි.

ගංජා වල අඩංගු ප්‍රධාන මනෝ ක්‍රියාකාරී රසායනික ද්‍රව්‍ය ඉහළ සාන්ද්‍රණ වලින් දැන් කෘත්‍රිමව නිපදවා ඇත. මේවා ද නීතිගත කිරීමක් පවතින රටවල අලෙවි කෙරේ. එබැවින් ගංජා වගා කිරීමද නුදුරු අනාගතයේදී නැතිවී යනු ඇත.

ලොව පුරා ගංජා ආශ්‍රිත නිෂ්පාදන වලින් බටහිර වෛද්‍ය විද්‍යාව හරහා ප්‍රතිලාභ ලබන රෝගීන් ඉතා අල්පය. තවද

**ගංජා නිෂ්පාදන යම් ආකාරයක බලපෑමක් පෙන්නුම් කර ඇති රෝගාබාධ සඳහා වෙනත් ඖෂධ දැනටමත් බහුලව භාවිතා වේ.**

ගංජාවල ඇති රසායනය අතලොස්සක් සඳහා ප්‍රතිකාර කිරීමේදී යම් බලපෑමක් ඇති බව පෙන්නුම් කිරීමෙන් අදහස් කරන්නේ ගංජා සමස්ත ජනතාවටම භාවිතා කිරීම සඳහා නීතිගත කළ යුතු බව නොවේ. ගංජා ශාකයෙන් ලුණු ඇඹරීමට හැකිවීමද එසේ කිරීමට හේතුවක් නොවේ.

හෙරොයින් වල රසායනය බටහිර වෛද්‍ය විද්‍යාවේ භාවිතා වන මෝෆීන්, පෙතිඩීන් ආදී ඖෂධ කිහිපයක සමානය. නමුත් හෙරොයින් භාවිතය නීතිගත කර නොමැත. සෑම කෙනෙකුම මෝෆීන් හෝ හෙරොයින් නිෂ්පාදනය කර භාවිතා කල හැකිවන ලෙස නීති වෙනස් කිරීමට ඉල්ලා සිටීම කිසිවෙකු සිදු නොකරයි.

ශ්‍රී ලංකාවේ ගංජා වගා කිරීම හා භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා එහි ඇති ආයුර්වේද වටිනාකම නිර්දය ලෙස භාවිතා කර ඇත. වසර දහස් ගණණක් පැවත එන ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට මෙය නිග්‍රහයකි. ශ්‍රී ලංකාවේ ගංජා වගාව, නිෂ්පාදනය හා භාවිතය තහනම් කර ඇත. කෙසේ වෙතත්, සමහර ආයුර්වේද ඖෂධ සඳහා ගංජා අවශ්‍ය නිසා ඖෂධීය අරමුණු සඳහා ගංජා (කංසා) භාවිතා කිරීමට අවසර ඇත.

**ආයුර්වේද වෘත්තිකයින්ට ගංජා සැපයීම සඳහා ක්‍රමවේදයක් රජය විසින් දිගු කලක සිට ස්ථාපිත කර තිබේ.**

මෙම ක්‍රමය දිගටම කරගෙන යාම සඳහා ගංජා හිඟයක් තිබේ නම්, එවැනි අඩුපාඩුවක් සපුරාලිය හැක්කේ කෙසේදැයි සොයා බැලිය යුතුය.

ගංජා වගා කිරීමට මිනිසුන් යොමු කිරීම එවැනි හිඟයකට විසඳුමක් නොවේ. හෙරොයින් සම්බන්ධ මෑත අත්දැකීම් ඉතා පැහැදිළි ලෙස පෙන්වා දී ඇති පරිදි ශ්‍රී ලංකාවේ මෙසේ ගංජා නිෂ්පාදනය කලහොත් සාමාන්‍ය මහජනයා අතට ගංජා පත්වීම නොවැළැක්විය හැකිය. දැඩි කොන්දේසි යටතේ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ආනයනය කිරීම වඩාත් පිළිගත හැකි හා ප්‍රායෝගික විසඳුමක් වනු ඇත. මේ සඳහා දැනට නීතිමය බාධාවක් නොමැත.